# Covid 19 සති පාසල සබරගමුව පළාත
## 9 ශ්‍රේණිය - ඉතිහාසය
## ඒකකය - 01/02/03
## විශේෂ ඇගයීම් අංක 02
## පැවරුම් අංක 05

පසුගිය සතිය තුළ තුන්වන ඒකකය හා බැඳුණු ව්‍යුහගත ප්‍රශ්ණාවලියට ඔබ පිළිතුරු සැපයූ අතර මෙම සතිය තුළ අප විෂය නිර්දේශයේ 1,2,3 යන ඒකක ආවරණය වන ලෙස සැකසුන රචනා ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සපයමු.

- මෙමඟින් පසුගිය විෂය කොටස් නැවත ආවර්ජනය කිරීම අරමුණ වේ.
- මේ සඳහා පිළිතුරු සැපයීමට පෙළපොත යොදා ගන්න .
- ඔබගේ සටහන් පොතෙහි අදාල ප්‍රශ්න සටහන් කොට පිළිතුරු සපයන්න.

1. i. ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ වල බලය පිහිටුවා ගත් යුරෝපීය ජාතිකයින් තුනක් දක්වන්න.
   ii. ක්‍රිස්තු වර්ෂ 1638 දී දෙවන රාජසිංහ රජු හා ලන්දේසි අතර ඇති වූ ගිවිසුමේ කොන්දේසි දෙකක් සටහන් කරන්න.
   iii. ලන්දේසීන් විසින් පාලනය සඳහා දිවයින බෙදාවෙන් කර තිබූ කොටස් තුන දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

2. i. ලන්දේසීන් සිවිල් පාලනයේදී යොදාගත් දේශීය නිලධාරීන් තිදෙනෙකු දක්වන්න.
   ii. ලන්දේසීන් මෙරට පිහිට වූ අධිකරණ වර්ග හතර ලියා දක්වන්න.
   iii. ලන්දේසින් තම ආදායම ඉහළ නංවා ගැනීමට ගත් ක්‍රියා මාර්ග දෙකක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

3. i. ඉංග්‍රීසින් මෙරටින් ලබාගත් කුළු බඩු වර්ග තුනක් දක්වන්න.
   ii.ක්‍රිස්තු වර්ෂ 1797 මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ලට හේතු වූ සාධක දෙකක් දක්වන්න.
   iii. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු සාධක තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

4. i. බ්‍රිතාන්‍යයන් මෙරටට හඳුන්වා දුන් වතු වගාවන් තුනක් ලියා දක්වන්න.
   ii. බ්‍රිතාන්‍යයන් තම ආදායම ඉහළ නංවා ගැනීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.
   iii. a) කෝපි වගාවේ දියුණුවට බලපෑ සාධක තුනක් දක්වන්න.
        b) 1948 න් පසු කෝපි වගාව පරිහානියට බලපෑ සාධක දෙකක් දක්වන්න.

5. i. 1818 නිදහස් සටන සටනට නායකත්වය සැපයූ නායකයින් තිදෙනකු දක්වන්න.
   ii. 1818 නිදහස් සටනට බලපෑ සාධක හතරක් ලියා දක්වන්න.
   iii. 1848 නිදහස් සටනට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

6. i. මෙරට බෞද්ධ පුනර්ජීවනයට නායකත්වය ලබාදුන් නායකයින් තිදෙනෙකු දක්වන්න.
   ii. බෞද්ධ පුනර්ජීවනයට ගත් ක්‍රියා මාර්ග හතරක් දක්වන්න.
   iii. මිෂනාරිවරුන් විසින් ආගම ප්‍රචාරය කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් දක්වා එයින් එකක් විස්තර කර ලියන්න.

සැකසුම - උදාර අරවින්ද මයා - ර/නිවි/ කලවාන ජාතික පාසල
- නිවිතිගල අධ්‍යාපන කලාපය